# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනයේ දී සංචාරකයින් සහ දේශීය ප්‍රජාව මුහුණ දෙනු ලබන ගැටලු

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එන්. පී. ටී. සී. අමරසිංහ***[1]
***එම්. ගුණරත්න***[2]

---

**සංක්ෂේපය**

මෙම අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය කර ඇත. වර්තමානය වන විට සංචාරක කර්මාන්තය තුළ දේශීය ප්‍රජාව සහ සංචාරකයින් මුහුණ දෙනු ලබන ගැටලු වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනයේ දී සංචාරකයන් සහ දේශීය ප්‍රජාව මුහුණ දෙන ගැටලු මොනවාද? යන්න අධ්‍යයන ගැටලුව ලෙස යොදා ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනයේ දී සංචාරකයන් සහ දේශීය ප්‍රජාව මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස පින්නවල සංචාරක කර්මාන්තය තෝරා ගෙන ඇත. පින්නවල සත්වෝද්‍යානය සහ අලි අනාථාගාරය ආශ්‍රිත ප්‍රදේශවල සංචාරය කරනු ලබන දේශීය විදේශීය සංචාරකයන් 40 ක සසම්භාවී නියැදියක් ගෙන ප්‍රශ්නාවලී ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. ග්‍රාමීය ප්‍රජාව තෝරා ගැනීමේ දී පොකුරු නියැදි ක්‍රමය ආශ්‍රිතව පුද්ගලයන් 30 ක නියැදියක් ගෙන ඇත.

මෙම අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව දේශීය සංචාරකයන් පිළිබඳව සලකා බැලීමේ දී වෙළෙඳපොළ මිල ගණන් අධික බව ඔවුන්ගේ ප්‍රධාන ගැටලුවක් විය. එමෙන්ම පින්නවල සත්වෝද්‍යානය සහ අලි අනාථාගාරය නැරඹීම සඳහා ලබා දෙන ප්‍රවේශපත්‍රවල මිල අධික බව ද සෑම දෙයක්ම මිල මුදලට යටත්ව මෙම ප්‍රදේශය තුළ පවතින බවත් හෙළි විය. විදේශීය සංචාරකයන් නිරීක්ෂණය කළ පසු දැකිය හැකි වූයේ දේශීය සංචාරකයන්ට වඩා විදේශීය සංචාරකයන්ට අලෙවි කරන භාණ්ඩවල මිල අධික බවත් අනාවරණය විය. අනෙක් අතට ග්‍රාමීය ජනයා මුහුණ දුන් ගැටලු අතර වෙළෙඳාම් කිරීමේ දී දියුණු ප්‍රවාහන පද්ධතියක් නොමැති බවත් වෙළෙඳාම් කටයුතු කාලයකට පමණක් සීමා වන බවත් දැක ගත හැකි විය. එලෙසම මොවුන් මුහුණ දුන් තවත් ගැටලුවක් වූයේ නිසි කළමනාකාරීත්වයකින් යුතුව කුණු කසල බැහැර කිරීමේ හැකියාවක් නොමැති බව යි. අධ්‍යයන ප්‍රතිඵල අනුව ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය ව්‍යාපාරය සංචාරක කර්මාන්තය නිසාවෙන් ඇති වී ඇති ගැටලු බැව් හෙළි විය. මේ අනුව සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා මෙම ගැටලු විසඳීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ සංචාරක ව්‍යාපාරය, සංචාරක ගැටලු, සංචාරකයා, දේශීය ප්‍රජාව**

---

1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය